# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 77 — 1973 සැප්තැම්බර් 14 වැනි සිකුරාද — 1973.09.14**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

**(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1233 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1240 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 1241 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සැලකිය යුතුයි.**—යුක්තිය පසිඳලීමේ පනත් කෙටුම්පත සහ ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 07 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 01 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුළ—

(අ) කොළඹ සහ දියතලාවේ පිහිටි ශ්‍රී ලංකා යුදහමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරුවලට සහ පනාගොඩ පිහිටා ඇති ශ්‍රී ලංකා යුදහමුද කඳවුරුවලට එළවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම,

(ආ) දියතලාවේ පිහිටා ඇති ශ්‍රී ලංකා යුදහමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරුවලට සහ පනාගොඩ, තල්ලාඩි (මන්නාරම) තොඩ්ඩවලි (මන්නාරම) පිහිටා ඇති ශ්‍රී ලංකා යුදහමුදාවේ කඳවුරුවලට අළුත් මාළු වර්ග සැපයීම

සඳහා 1973 ඔක්තෝබර් මස 08 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ බාලදක්ෂ මාවතේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1973 ඔක්තෝබර් මස 04 වෙනි දින පෙරවරු 10 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
වැ. බ. යුද්ධහමුදාධිපති, ශ්‍රී ලංකා යුදහමුදාව.

1973 අගෝස්තු මස 28 වෙනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9-313/1—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 01 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල—

(අ) කොළඹ සහ දියතලාවේ පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරුවලට හා පනාගොඩ පිහිටා ඇති ශ්‍රී ලංකා යුදහමුදාවේ කඳවුරුවලට මස් වර්ග සැපයීම,

(ආ) ල.යු.පු.බ අනුබණ්ඩය, යාය අංක. 18 ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩල, කන්තලේ, යාපනය, එලිෆන්ට්පාස් සහ මුලතිව් පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධහමුදා කඳවුරුවලට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අළුත් මාලු වර්ග සැපයීම,

(ඇ) තල්ලාඩි (මන්නාරම) සහ තොඩ්ඩවලි (මන්නාරම) පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කඳවුරුවලට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සහ මස් වර්ග සැපයීම

සඳහා 1973 ඔක්තෝබර් මස 08 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ, බාලදක්ෂ මාවතේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුයි.

පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1973 ඔක්තෝබර් මස 04 වෙනි දින දහවල් 12 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ, පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
වැ. බ. යුද්ධ හමුදාධිපති, ශ්‍රී ලංකා යුදහමුදාව.

1973 අගෝස්තු මස 28 වෙනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9-313/2—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 01 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල සිලාවතුරේ, අම්පාරේ, අනුරාධපුර, නුවර එලිය, උඩවලවේ සහ පදවිය පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරුවලට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අළුත් මාළු වර්ග සැපයීම සඳහා 1973 ඔක්තෝබර් මස 09 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ, බාලදක්ෂ මාවතේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉහත සඳහන් සැපයීම් පිණිස නැවත ලබා ගතහැකි රු. 75 ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුයි. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1973 ඔක්තෝබර් මස 04 වෙනි දින පෙරවරු 10.30 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත.

වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
වැ. බ. යුද්ධහමුදාධිපති, ශ්‍රී ලංකා යුදහමුදාව.

1973 අගෝස්තු මස 28 වෙනි දින.
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය.
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9-313/3—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1974 ජනවාරි මස 01 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල වෙම්පන්කුණ්ඩු, කෑගල්ල, මහනුවර, බූස්ස, මාතර, මහියංගනය සහ වැල්ලවාය පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරුවලට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අළුත් මාළු වර්ග සැපයීම සඳහා 1973 ඔක්තෝබර් මස 10 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ, බාලදක්ෂ මාවතේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉහත සඳහන් සැපයීම් පිණිස නැවත ලබා ගත හැකි රු. 75 ක මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුයි. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1973 ඔක්තෝබර් මස 04 වෙනි දින පෙරවරු 10.30 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත.

වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනගතහැකිය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
වැ. බ. යුද්ධහමුදාධිපති, ශ්‍රී ලංකා යුදහමුදාව.

1973 අගෝස්තු මස 28 වෙනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹ 3.

9-313/4—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

#### හෙරන් ගුවන් යානා ආසන කුෂන් කිරීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, තැ. පෙ. 594 පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි, සැපයීමේ සහ නඩත්තු කිරීමේ ඩිපෝවෙහි තිබෙන හෙරන් ගුවන් යානා ආසන 34 ක් කුෂන් කිරීම සඳහා 1973 ඔක්තෝබර් මස 03 වෙනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. මෙම සේවයට අදාල සාම්පලයක් ගුවන් හමුදා මූලස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1973 ඔක්තෝබර් මස 02 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන් ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාධිපති.

9-324—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් 31 වෙනි දින දක්වා වූ කාල සීමා තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා කොළඹ 2, තැ. පෙ. 594 ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙන් III වැනි ජේදයෙහි දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| (I) සැපයීම්/සේවාවන් | (II) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අවසාන දිනය | (III) ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘතකරන දිනය |
|---|---|---|
| (අ) ත්‍රිකුණාමලය පිහිටි යුද හමුදාවට, ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ චීනවරාය පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු වලට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම ... ... ... | 1973.10.04 ... | 1973.10.05 |
| (ආ) ත්‍රිකුණාමලය පිහිටි ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ චීනවරායේ පිහිටි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට පාන් සහ ස්වදේශීය උඳසන ආහාර සැපයීම ... ... ... ... | 1973.10.04 ... | 1973.10.05 |
| (ඇ) කටුනායක පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරට නිල ඇඳුම් සහ බැරැක්ක රෙදිපිළි ඇපිල්ලීම ... ... | 1973.10.04 ... | 1973.10.05 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට ප්‍රථම කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරය සඳහා නැවත ලබාගතහැකි රු. 75/- මුදලක් තැන්පත් කර රිසිට් පතක් බැගින් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙහි II වැනි තීරයෙහි දක්වා ඇති දිනයන්හි දහවල් 12.00 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් ලබාගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති,

9-323—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයේ ප්‍රාදේශීය ගබඩා අංගනයේ තිබෙන මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි බඩු මිළදී ගැනීම හා ඉවත් කර ගැනීම සඳහා මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1973. 10. 04 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

| ද්‍රව්‍යය නාමය | ප්‍රමාණය |
|---|---|
| හිස් සිමෙන්ති උර | ... 5000 (පමණ) |
| පරණ පුවත්පත් පත්‍ර | ... රාත්තල් 1722 (පමණ) |
| විවිධ ගබඩා ද්‍රව්‍ය | |

2. සියලුම ටෙන්ඩර් පත්‍ර 1973. 09. 29 දින දවල් 12 දක්වා මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවා පිටපත් දෙක බැගින් එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘතියක් ලබා ගැනීමට පෙර, මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ රුපියල් 25 ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, කවරයේ වම් පස මුදුනේ "හිස් සිමෙන්ති උර මිළදී ගැනීමේ ටෙන්ඩරය" යනුවෙන් ලියා මුද්‍රා තබා මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි වෙත එවිය යුතුයි. කවරයේ වම් පස පහලින් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද ලිවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. එසේ නොමැති නම්, මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

4. 1973. 10. 04 දින ප. ව. 2 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ගේ කැමැත්ත පරිදි ටෙන්ඩර් විවෘත කරන ස්ථානයට පැමිණ සිටිය හැක.

5. එක් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් සියල්ලටම හෝ ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන්ට පුළුවන. මේ සඳහා දක්වන මිළ ගණන් වෙන වෙනම ඉලක්කම් වලින් මෙන්ම, අකුරෙන්ද පැහැදිලිව ටෙන්ඩර් පෝර්මයේ සඳහන් කළ යුතුයි. ඉලක්කමෙන් හා අකුරෙන් තබන ලද සටහන්වල පරස්පර විරෝධිතාවයක් හෝ වෙනත් මැකීම් ආදියක් හෝ වේනොත් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. මෙම ද්‍රව්‍යයන් මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලයේ ප්‍රාදේශීය ගබඩාවේ දී සතියේ දිනවල කාර්යාල වේලාවන් හිදී පරීක්ෂා කර බැලිය හැක.

7. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් දස දිනක් තුලදී එහි සඳහන් මුලු මුදල ගෙවිය යුතුයි. මුදල ගෙවා දින දහ හතරක් (14) තුළ එම ගබඩා ද්‍රව්‍යයන් ඉවත් කර ගෙන යා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැල් කිරීමෙන් හෝ එම ලිපිනයෙහි තැන්පත් කිරීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දන්වූවාසේ සලකනවා ඇත. මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි විසින් වෙන අන්දමකට තීරණය නොකළහොත් නියමිත කාල සීමාව තුලදී ගෙන නොගොස් ගබඩාවේ ඉතිරිවන බඩු නැවත විකුණා දැමීමට හෝ වෙනත් සුදුසු දෙයක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැක.

8. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ටෙන්ඩරය අස්කර ගන්නා බව නොදන්වුවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවුහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරා ගත් බව දන්වීමෙන් පසුව නියමිත කාල සීමා තුලදී මුදල නොගෙවා හෝ බඩු ඉවත් නොකර හෝ හැරියොත් තැන්පත් මුදල රාජසන්තක කරනවා ඇත.

9. තෝරාගත් ටෙන්ඩර්කරුවෙකු බඩු ගෙන යාම ප්‍රතික්ෂේප කල හොත් හෝ ගෙන යාමට බැරි වුවහොත් හෝ තැන්පත් මුදල රාජසන්තක කරනු හැර සොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයේ ඔහුගේ නම ඇතුලත් කිරීමටද ඉඩ තිබේ.

10. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් හෝ භාර ගැනීමේ අයිතිය මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි වෙත තිබේ.

එස්. කුමාරස්සාමි,
මාන්කුලම ඉඩම් සංවර්ධන නිලධාරි.

1973 අගෝස්තු මස 31 දින,
ඉඩම් සංවර්ධන නිලධාරි කාර්යාලය,
මාන්කුලම.
9-247 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිළ ගණන් කැඳවීම

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973 සැප්තැම්බර් මස 27 වැනි දින පස්වරු 2 දක්වා කොළඹ 5, නාරාහේන්පිට, නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන) විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

(1) හොඳින් පුළුස්සන ලද මධ්‍යම ප්‍රමාණයේ හොඳ වර්ගයේ ගඩොල් 2,000 යි.

(2) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් 3 යි.

(3) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ $\frac{3}{4}$" සහ 1$\frac{1}{2}$" කැට ගල් කියුබ් $\frac{1}{2}$ බැගින්.

(4) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ තම්බන ලද හුණු බුසල් 60 යි.

(5) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අළුනුණු බුසල් 30 යි.

මෙම ද්‍රව්‍යයන් පහත සඳහන් ස්ථානයට ගෙනවිත් භාරදිය යුතුය. "රජයේ පශු වෛද්‍ය කාර්යාලයේ වැඩබිම, හලාවත"

2. මෙම සියළු ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්ත්වයේ ඒවා විය යුතුය.

3. මෙම එක් ගොඩනැගිලි ද්‍රව්‍යයකට හෝ කොටසකට හෝ සියල්ල ටම හෝ ටෙන්ඩර් කළ හැකිය.

4. ටෙන්ඩර් ආකෘතිපත් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන්" යන්න සඳහන් කොට සියළුම ටෙන්ඩර් අත්සන් තබා සිල්කර තැපෑලෙන් 1973 සැප්තැම්බර් මස 27 වැනි දින පස්වරු 2ට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන) වෙත එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර් පත් අනුමත කරන ලද දිනයේ සිට දින 40 ක කාලයක් තුළ භාරගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන) තැන ගෙන් අසා දැන ගත හැකිය.

ජේ. කේ. ඊ. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

1973 අගෝස්තු මස 23 වැනි දින,
වැඩපල හා යාන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728,
කොළඹ 5.

9-252 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**පුත්තලම් දිස්ත්‍රික්කයේ මාදම්පේ සැපයීම් මධ්‍යස්ථානයේ කම්කරු හා ප්‍රවාහණ සේවා සඳහා මිල ගණන් කැඳවීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ මාදම්පේ සැපයීම් මධ්‍යස්ථානයේ පහත සඳහන් කම්කරු හා ප්‍රවාහණ සේවා සඳහා ග්‍රාම සංවර්ධන සමිති, සමූපකාර සමිති හා කම්කරු සමිති හා වෙනත් ලියාපදිංචි පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද 1973 ඔක්තෝබර් 01 සිට 1974 දෙසැම්බර් 31 දක්වා මිල ගණන් පිළිබඳව සීල් තබන ලද ටෙන්ඩර් පත් 1973. 09. 28 දින පස්වරු 2 දක්වා ම විසින් බාරගනු ලැබේ :—

(අ) සැපයීම් මධ්‍යස්ථානයේ සහල්, පිටි ආදි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම හා නිකුත් කිරීම සම්බන්ධ කම්කරු සේවා,

(ආ) මාදම්පේ දුම්රිය ස්ථානයේ දී දුම්රිය වැගන්වලින් සහල්, පිටි හා 'ඇදිනැස' බිස්කට් ආදි ආහාර ද්‍රව්‍ය බෑම හා සැපයීම් මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහණය කිරීම.

2. පුත්තලම කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක රුපියල් 25 ක් තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1973. 09. 24 දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් ෆෝර්ම මගේ කායාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව මෙම කායාලයෙන් ලබාගන්නා ෆෝර්මවල පමණක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම් කෙලවරේ, "මාදම්පේ සැපයීම් මධ්‍යස්ථානයේ කම්කරු හා ප්‍රවාහණ සේවා සඳහා ටෙන්ඩර්" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම ලේඛනගත තැපෑලෙන් එවිය යුතු අතර, නොඑසේනම් මගේ කායාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක.

3. ටෙන්ඩර් පත් විවෘත කිරීම 1973. 09. 28 පස්වරු 2.10 ට මෙම කායාලයේ දී සිදු කෙරේ. මෙම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

4. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කිරීම හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ එයින් කොටසක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ටෙන්ඩර් මණ්ඩලය සතුය.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් රුපියල් 250 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර පිළිගත් බව දැනුම් දීමෙන් දින 7ක් තුල ගිවිසුමක් අත්සන් කිරීමට සූදානමින් සිටිය යුතුයි. ටෙන්ඩරය පිළිගත් බව සඳහන් ලියවිලි පිළිගත් ටෙන්ඩර්කරුට පුද්ගලිකව බාරදීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බව දැන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම අත්සන් කිරීමට අතපසු කල හොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා ඇත. අසාර්ථක ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනුයේ පිළිගත් ටෙන්ඩර් කරු විසින් ඇප මුදල තැන්පත් කළ පසුවය.

6. මෙම කොන්ත්‍රාත්තුව කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි. ඔවුන්ට වේතන ගෙවීම දැනට බලපවත්නා හා මතුවට ක්‍රියාත්මක විය හැකි අණපනත් හා රෙගුලාසිවලට අනුකූල විය යුතුයි.

7. මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර පුත්තලම නියෝජ්‍ය ආහාර පාලක කායාලයෙන් ලබාගත හැක.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
පුත්තලමේ සහකාර ආහාර පාලක.

1973 සැප්තැම්බර් මස 01 දින,
පුත්තලම, දිසාපති කායාලයේ දිය.

9-249 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ 5, නාරාහේන්පිට, නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5, නාරාහේන්පිට වැඩපල හා යන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 සැප්තැම්බර් මස 27 වැනි දින සවස 2 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

"මෘදු වානේ විදුලි පැස්සුම් කූරු" සැපයීම

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "මෘදු වානේ විදුලි පැස්සුම් කූරු සැපයීම" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයුම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළිගැනීමේ හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර්පත් දෙපිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. ඊ. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යාන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728, කොළඹ 5,
1973 අගෝස්තු මස 24.

9-253 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

සර්විස් හොයිස්ට් 2ක් සැපයීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා 73.10.05 වෙනි දින ප. ව. 1.30 තෙක පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ඉන්දියාවේ නිෂ්පාදිත යන්ත්‍රෝපකරණ සඳහා වූ මිල ගණන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

ටෙන්ඩර් අංකය : එම්. ඊ/727318 ; සැපයීම් විස්තර : සර්විස් හොයිස්ට් 2 යි ; අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල : රු. 25.

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එම පිටපත් නිසියාකාරව සම්පූර්ණ කර අත්සන් තබා සීල් තැබූ කවරයක බහා එහි වම් උඩ කෙළවරේ "සර්විස් හොයිස්ට්" සඳහා ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 73.10.05 දින ප. ව. 1.30 යන්න සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. 73.10.04 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. මින් පසු ටෙන්ඩර් නිකුත් කරනු නොලැබේ.

5. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩරය වෙනුවෙන් තැන්පත් කළ යුතු මුදල වන රු. 25 පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමේ අයට මුදල් තැන්පත් කළ බවට නිකුත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

6. කිසිම වග විභාගයක් නොමැතිව, එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම ටෙන්ඩර් පහාකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාර ගැනීමේ හිමිකම් රජය සතු වේ.

7. වැඩිමනත් විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකියි.

එස්. කතිරගාමිතම්බි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 සැප්තැම්බර් 1 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේදී ය.

9-251—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය**

**ගාල්ල රෝහලේ සහ බලපිටිය රෝහලේ විකිරණ විද්‍යා අංශවල පරිහරණයෙන් පසු ඉවතලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය විකිණීම**

1974 ජනවාරි 1 දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල යට දැක්වෙන උපලේඛනයේ සඳහන් ආයතනවල විකිරණ විද්‍යා අංශයන්හි කළුවර කාමරවලින් ඉවතලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය මිළයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් එවිය යුත්තේ පිටපත් දෙකකින් යුක්තව මෙම කායාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පමණකි. 73.10.15 දින දවල් 12 වන තුරු ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පලමු ඉල්ලුම්කරුවන් විසින් රු. 50 ක් දිසාපති කායාලයක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා පැමිණීමට අපහසු ටෙන්ඩර් කරුවන්ට මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සිය එවා ටෙන්ඩර්පත් තැපැල් මගින් ඉල්ලුම් කළ හැක. මට තැපැල් මගින්ම ටෙන්ඩර් පත් එවීමට හැකිවන පරිදි මෙවැනි ඉල්ලීම් කල් වේලා ඇතිව කළ යුතුය. ටෙන්ඩර්පත් සීල් තබා පිටකවරයේ වම් පස මුදුනේ "පරිහරණයෙන් පසු ඉවත ලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය මිළයට ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට 73.10.16 දින උදේ 10 ට පළමු ලැබෙන සේ ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

3. තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බවට ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් නිවේදනයක් ලැබී දින 14 ක් ඇතුළත ටෙන්ඩරයේ සඳහන් මුදල ගෙවීම පැහැර හැරියොත් හෝ ගෙවීමට අපොහොසත් වුවහොත්, එම ටෙන්ඩර් කරුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

4. ටෙන්ඩර් පත් ලේඛණගත තැපෑලෙන් එවීමට හෝ සීල් තැබූ කවරයක බහා ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරීට භාරදී ලැබුන බවට ලියවිල්ලක් ලබාගැනීමට හෝ ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමට හෝ පුළුවන.

5. 73.10.16 දින උදය 10 ට ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවට එහි සිටිය හැක.

6. ජයග්‍රාහී ටෙන්ඩර් කරු විසින් රු. 100 ක ඇප මුදලක් තබා කොන්ත්‍රාත්තුව නිසියාකාර කරන බවට පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුය.

7. ඉවතලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය සඳහා සෑම මාසය කම වැඩ කරණ පළමුවන දිනයේ දවල් 12 ට පළමු මුදල් ගෙවිය යුතුය.

8. ඉවත ලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය එකතු කිරීම සඳහා හිස් භාජන සැපයීමට ජයග්‍රාහී ටෙන්ඩර්කරුට සිදුවේ.

9. ප්‍රශ්නයක් නොමැතිව එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා කරුණාකර අදාළ ආයතන ප්‍රධානීන් හමුවන්න.

එල්. එන්. ද එස්. ජයසූරිය,
ගාල්ලේ වැඩබලන සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 අගෝස්තු මස 30 දා, ගාල්ලේ,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

**උපලේඛනය**

| ආයතනයේ නම | | වර්ෂයක් තුළදී මිළයට ගත හැකි ඉවතලන පික්සර් ද්‍රාවණ ප්‍රමාණය දළ වශයෙන් |
|---|---|---|
| ගාල්ල මහ රෝහල | ... | ගැලුම් 56 |
| බලපිටිය රෝහල | ... | ගැලුම් 48 |

9-237—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කුඹල් කර්මාන්තය සඳහා පාසක (කික්විල්ස්) 20ක් සැපයීම සඳහා 1973. 10. 03 දින පෙ. ව. 10 වන තෙක් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැක.

යොමු අංකය : 3/1—(3/43)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.09.01.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

9-362—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බලවේග පේෂකම් යන්ත්‍ර අමතර කොටස් සැපයීම සඳහා 1973.10.15 දින පෙ. ව. 10 වන තෙක් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැක.

යොමු අංකය : 3/1—(3/15)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973. 09. 01.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

9-234—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 වෙනි ස්ථානයේ ලංකා ගමනාගමන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් නිල ඇඳුම් රෙදි සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර 1973 ඔක්තෝබර් මස 17 වෙනි දින පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ :—

(1) කාකි ඩ්‍රිල් 28"/29" පළල (සැන්ෆෝරයිස්ඩ්) යාර 210,000
(2) අළු පාට ටසෝ 28"/29" යාර 41,000
(3) නිල් පාට ඩ්‍රිල් යාර 2,500
(4) කළු පාට ටසෝ යාර 185,000

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝරමවල ලියා අනු පිටපතකින් ද යුක්ත කොට එවිය යුතුය. මෙම පෝරම පත් බොරලැස්ගමුවේ, වේරහැර, ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරී තැනගේ කාර්යාලයෙන් 1973 ඔක්තෝබර් මස 16 වන දින දවල් 12 වනතෙක් ලබා ගත හැකිය. මෙම පෝරම පත් ලබා ගැනීමට එම ස්ථානයේ මුදල් අංශයේ නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් ආපසු නොගෙවන රු. 10 ක ගෙවීමක් හා ආපසු ලබා ගත හැකි රු. 100 තැන්පත් මුදලක් ද ගෙවා ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සි මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර අවශ්‍ය වේනම් මගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනා ගමන මණ්ඩලය.

වේරහැර,
බොරලැස්ගමුව,
73. 08. 27.

9-301—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය නගරසභා කොට්ඨාශය තුළ ඇති රජයේ නිවාසවල බාල්දි වැසිකිළි වෙනස් කර ජල මුද්‍රිත වැසිකිළි තැනීම

නුවරඑළිය නගරසභා කොට්ඨාශය තුළ පිහිටා තිබෙන රජයේ නිවාසවල ඇති බාල්ලි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට පරිවර්තනය කිරීම සඳහා 1973.09.28 දින පෙරවරු 11 දක්වා පිළිගත් ග්‍රාම සංවර්ධන සමිතිවලින්, සමූපකාර සමිතිවලින්, කම්කරු සමිතිවලින් හා වාරිමාර්ග, දුම්රිය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති (රු. 15,000 සිට ඉහළට) ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ. 1973.09.28 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ටෙන්ඩර් පත්‍ර වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් කෙළවරෙහි "රජයේ නිවාසවල ජල මුද්‍රිත වැසිකිලි" යනුවෙන් සඳහන් කළ යුතු අතර ටෙන්ඩර් පත්‍ර සහිත කවරය මුද්‍රා තැබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර, දිසාපති, නුවරඑළිය යන ලිපිනයට අනුපිටපතකින් ද යුතුව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

3. ලේඛනගත තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ කාර්යාල සහකාරට හෝ අතිරේක කාර්යාල සහකාරට හෝ පෞද්ගලිකව භාරදිය යුතුය.

4. 1973.09.27 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම ටෙන්ඩරයක් වෙනුවෙන් ම රු. 25 ක් 'නුවරඑළියේ දිසාපති' නමින් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙසේ ටෙන්ඩර් මුදල තැන්පත් කිරීම ශ්‍රී ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයක කළ හැකිය. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා එසේ ඔහුගේ ටෙන්ඩරය තෝරා ගත් බව දන්වා සති දෙකක් ඇතුළත ටෙන්ඩරයේ වටිනාකමින් සියයට 5ක ඇප මුදල් තැන්පත් කර සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කළ යුතුය. මෙම කොන්දේසි කඩ කරන ටෙන්ඩර්කරුවාගේ නම වැඩ පැහැර හැරිය ටෙන්ඩර්කරුවන්ගේ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

5. නියමිත ටෙන්ඩර් පෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසිවලට පටහැනිව සකස් වී ඇති සියළුම ටෙන්ඩර් පත්‍ර, පිළිගත හැකි ටෙන්ඩර් පත්‍ර ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් ඉතා පැහැදිළිව තීන්තෙන් ලිවිය යුතු අතර, එහි යම් වෙනස් කිරීමක් හෝ කපු ගෑමක් වේනොත්, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා එය සහතික කළ යුතුය.

6. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ටෙන්ඩරයේ ඉතා පැහැදිළිව ලිවිය යුතුය.

7. යම්කිසි ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නැත්නම් ටෙන්ඩරයෙන් කොටසක් පිළිගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ඇත.

8. පත්කරගනු ලැබුවා වූ ටෙන්ඩර්කරුවන් එම සේවාව සඳහා 'ලාංකික' කම්කරුවන් පමණක් ගත යුතුය. 'ලාංකික' යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වූ තැනැත්තකු යන්නය.

9. 1934 අංක 19 දරණ කම්කරු 'වන්දි' ආඥාපනතේ 11 පරිච්ඡේදය යටතේ තමාගේ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවනු ලබන ඉල්ලුම්පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

10. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් නැතහොත් කොන්ත්‍රාත්කරුගේ ලිපිනයට තැපැලෙන් යැව්වහොත් එය ඔහුගේ අතටම භාර දුන්නා සේ සැළකිය යුතුය.

11. නුසුදුසුයැයි කල්පනා කරනු ලබන යම්කිසි සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම සේවකයෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

12. වැඩ පැහැර හැරියහොත් කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම් සඳහන් වන කෙනෙකු සමග නම ඇතුළත්වූ හෝ ටෙන්ඩර් මණ්ඩලය විසින් විරුද්ධ වන කෙනෙකු සමග හෝ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

13. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන්, යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුය.

14. මේ පිළිබඳව වැඩි විස්තර නුවරඑළිය දිසාපති කාර්යාලයේ ලේඛනාගාරයෙන් සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාවන් තුළදී විමසා දැන ගත හැකිය.

15. මෙහි 4 වැනි වගන්තිය යටතේ සඳහන් ටෙන්ඩර් පෝරම සඳහා වූ මුදල් හෝ ඇප මුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවයෙන් ග්‍රාම සංවර්ධන සමිති, සමූපකාර සමිති සහ කම්කරු සමිති නිදහස් කරනු ලැබේ. එහෙත් මෙම සමිති දැනට ක්‍රියාත්මක බවට ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂගෙන්, සමූපකාර සංවර්ධන උප කොමසාරිස්ගෙන් හෝ කම්කරු උප කොමසාරිස්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

16. මෙහි 1 වැනි වගන්තිය යටතේ විස්තර කර තිබෙන වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලබන්නේ රජය විසින් අනුමත කර ඇති ගොඩනැගිලි ගාස්තු අනුවය.

ඇම්. සෙනෙවිරත්න බණ්ඩා,
නුවරඑළිය දිසාපති.

1973 අගෝස්තු මස 28 වෙනි දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේ දී ය.

9-308—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### බර උපකරණ පැටවීම සහ ප්‍රවාහණය කිරීම සඳහා එහා මෙහා ගෙනයාහැකි දෙඹකර සහ ට්‍රේලර සැපයීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් දේ සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100ක මුදලක් තැන්පත් කිරීමෙන් පසු ටෙන්ඩර් ලියකියවිලි සහ නියමිතයන් ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ටෙන්ඩර්පත් භාර ගැනීම 1973 සැප්තැම්බර් 20 වෙනි දින පෙ. ව. 10ට අවසන් කෙරේ.

113, ගාලු පාර,
කොළඹ 3.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

9-326/2—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1974 ජනවාරි 01 වනදා සිට 1974 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි 1 තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවාසංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණය දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙත"ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක්දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවර යෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුලත් වනසේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛණයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීමට අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර් කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරණ ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරණු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක මිලේ වෙනස කොන්ත්‍රාත් කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරණු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කරනු ලැබේ.

වෛද්‍ය ජේ. ඒ. බුද්ධදාස,
සෞඛ්‍ය සේවා අධිකාරී, මාතලේ.

1973 අගෝස්තු 28 වැනිද,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දීය.

උපලේඛණය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් සඳහා කැන්පත් | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දල වශයෙන්—1974 | | | | | | | | | |
| | | | | සේවකයන්ට | | | | | නොගෙවන රෝගීන්ට | | | | |
| | | | | මාළු | මස් | කරවල | එළවලු | බිත්තර | මාළු | මස් | කරවල | එළවලු | බිත්තර |
| 1. හිඟුරක්ගොඩ දි. රෝ. ... | 100 | ... 1,000 | | 500 | 500 | 500 | 1,500 | 500... | 4,000 | 4,000 | 4,000 | 12,000 | 4,000 |
| 2. ගලේවෙල ප. ඒ. ... | 100 | ... 800 | | 500 | 500 | 500 | 1,500 | 500... | 3,000 | 3,000 | 3,000 | 9,000 | 3,000 |
| 3. නාලන්ද ප. ඒ. ... | 100 | ... 800 | | 300 | 300 | 300 | 900 | 300... | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 |
| 4. රත්තොට ප. ඒ. ... | 100 | ... 800 | | 300 | 300 | 300 | 800 | 300... | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 |
| 5. මාදිපොල ප. ඒ. ... | 100 | ... 800 | 73.10.16 වැනි දින —පෙරවරු 10.00 ට | 400 | 400 | 400 | 1,200 | 400... | 1,000 | 1,000 | 1,000 | 3,000 | 1,000 |
| 6. කෝන්ගහවෙල ප. ඒ. ... | 100 | ... 800 | | 300 | 300 | 300 | 900 | 300... | 1,500 | 1,500 | 1,500 | 4,500 | 1,500 |
| 7. ලග්ගල පල්ලේගම ප. ඒ. | 100 | ... 800 | | — | 500 | 1,000 | 1,500 | 1,000... | — | 1,500 | 3,000 | 5,000 | 2,000 |
| 8. බකමූණ ප. ඒ. ... | 100 | ... 800 | | 300 | 300 | 300 | 900 | 300... | 1,200 | 1,000 | 1,000 | 5,000 | 2,000 |
| 9. මැදිරිගිරිය ප. ඒ. ... | 100 | ... 800 | | 500 | — | 1,500 | 1,000 | 300... | 2,000 | — | 2,000 | 6,000 | 3,000 |
| 10. බී. ඕ. පී. 400 ග්‍රා. රෝ. ... | 100 | ... 700 | | 400 | 400 | 400 | 1,200 | 400... | 1,000 | 1,000 | 1,000 | 3,000 | 1,000 |
| 11. අත්තනකඩවල ග්‍රා. රෝ. | 100 | ... 300 | | 300 | 300 | 300 | 900 | 300... | 300 | 300 | 300 | 900 | 300 |
| 12. ගිරිතලේ මාතෘ නිවාසය ... | 100 | ... 400 | | 200 | 200 | 200 | 600 | 200... | 500 | 500 | 500 | 1,500 | 500 |
| 13. උතුරු මාතලේ මාතෘ නිවාසය ... | 100 | ... 300 | | 100 | 200 | 100 | 600 | 200... | 700 | 700 | 700 | 2,000 | 500 |
| 14. ඕවිලිකන්ද මාතෘ නිවාසය | 100 | ... 400 | | 300 | 300 | 300 | 600 | 200... | 500 | 500 | 500 | 1,500 | 500 |
| 15. ඉළුක්කුඹුර මාතෘ නිවාසය | 100 | ... 400 | | 200 | 200 | 200 | 900 | 300... | 300 | 300 | 300 | 1,500 | 500 |
| 16. දේවහුව මාතෘ නිවාසය ... | 100 | ... 400 | | 300 | 300 | 300 | 900 | 300... | 500 | 500 | 500 | 1,500 | 500 |
| 17. ගල් අමුණ මාතෘ නිවාසය | 100 | ... 600 | | 300 | 300 | 300 | 900 | 300... | 800 | 800 | 800 | 2,400 | 800 |
| 18. මනම්පිටිය මාතෘ නිවාසය | 100 | ... 600 | | 100 | 100 | 100 | 300 | 100... | 300 | 300 | 300 | 900 | 300 |
| 19. යටවත්ත මාතෘ නිවාසය ... | 100 | ... 700 | | 200 | 200 | 200 | 600 | 200... | 500 | 500 | 500 | 1,500 | 500 |

9-250—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

# බඩුබාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

කල්මුනේ අඩවියේ නොයෙක් ස්ථානවල ඇති වන අපරාධවල අත්අඩංගුවට ගත් මිල්ල, සල්මිල්ල, බුරුත්ත, පානාක්කා, හෙලඹ යන වර්ගයෙන් දැව තොග නැගෙනහිර දිසා වන නිලධාරි විසින් කල්මුනේ අඩවි වන කාර්යාලයේ දී 1973.09.27 වැනි දින පෙ. ව. 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දැව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානවල ඇති දැව පරීක්ෂා කර බලා සෑහීමකට පත්විය යුතුයි.

වැඩි විස්තර සඳහා කල්මුනේ අඩවි වන නිලධාරි ගෙන් විමසන්න.

ඩබ්. ජේ. ජේ. මේදර්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

දිසා වන කාර්යාලයේ දී ය,
ඩමකලපුව, 1973 ජූලි මස 12 වන දින.

9-283 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ

### ප්‍රසිද්ධ වෙන්දේසිය

රාජසන්තක කරන ලද භාණ්ඩ කිහිපයක් 1973 සැප්තැම්බර් මස 22 වන දින දහවල් 12 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බැව් මෙයින් මහජනයාට දන්වමි.

2. වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට කලින් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනවා ඇත.

සී. මනෝහරා,
මහෙස්ත්‍රාත්.

1973 සැප්තැම්බර් මස 01 වන දින,
කොළඹ 1, ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

9-257—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## මාතර මහේස්ත්‍රාත් උසාවිය

### රාජසන්තක කළ සහ අයිතිවාසිකම් නොකියන භාණ්ඩ විකිණීම

මාතර මහේස්ත්‍රාත් උසාවියේ පවරන ලද නඩුවලට අදාල රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 06 වෙනි දින පස්වරු 2 ට මාතර මහේස්ත්‍රාත් උසාවි ගොඩනැගිල්ලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් නිවේදනය කර සිටිමි. අයිතිවාසිකම් නොකියන ලද භාණ්ඩ සඳහා අයිතිවාසිකම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට සති 2 ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කළ හැක.

(1) පාපැදි
(2) බත් බී කියත්
(3) අලවංගු
(4) ලී කොට
(5) කැති.
(6) ගැරුම් වට්ටි
(7) රබර් ෂීට්
(8) තවත් නානාවිධ භාණ්ඩ

(1) මෙම භාණ්ඩ වෙන්දේසිය කරන දින පස්වරු 1 සිට 2 දක්වා පරීක්ෂා කළ හැක.

(2) සම්පූර්ණ මුදල ගෙවා භාණ්ඩ වෙන්දේසිය අවසානයේ දී ගෙන යා යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(3) විකුණන ලද භාණ්ඩ ආපසු භාරගනු නොලැබේ.

ඩග්ලස් ජීජයරත්න,
මාතර මහේස්ත්‍රාත්.

1973 අගෝස්තු මස 29 වෙනි දින,
මාතර මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

9-238 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

පානදුර දිස්ත්‍රික් උසාවියේ අංක 1648/උ දරන නඩුවෙන් මට ලැබුණු බලය පිට විත්තිකාරියගෙන් පැමිණිලි කාරියට අය විය යුතු රු. 2,347 ක් සහ 69. 2. 6 දින සිට 71. 8. 4 දින දක්වා සියයට 18 ගණනේ රු. 1,500 ට පොලියද 71.8.4 වෙනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු සියයට 5 ක පොලිය සහ නඩු ගාස්තුව වශයෙන් රු. 250 ක් ද අයකර ගැනීම සඳහා මොරටුවේ, කටුකුරුන්දේ පිහිටි පර්චස් 23 5/8 විශාල අම්බලමේවත් තෝ "බී" අක්ෂරය දරණ 7 වෙනි කොටස සහ එහි පිහිටි සියළුම දේපල වල වෙන්දේසිය 1973. 10. 13 දින සවස 4 ට පිහිටි ස්ථානයේදී.

වැඩි විස්තර :

පානදුරේ ස්තෙම්බු සහ ස්තෙම්බු නිතිඥ මහතුන්ගෙන් හෝ මගෙන් විමසන්න.

සිරිල් සේනාරත්න,
උසාවියේ වෙන්දේසිකරු සහ
තක්සේරු කරු,

23, උසාවිය පාර,
පානදුර.

9-364 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාද | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 මැයි මස 04 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.